චක්‍රලේඛ අංක : 57

අපේ අංකය:- සං/තේ/පොල්/මිශ්‍ර/12
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර.
පැලවත්ත,
බත්තරමුල්ල.
2001. 09. 10 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

**පොල් සමග තේ මිශ්‍ර වගාව**
**වගාදිරි දීමනා ක්‍රමය යටතේ 2001 වර්ෂයේ**
**සිට ඉදිරියට ක්‍රියාත්මක කිරීම.**

**මෙම චක්‍රලේඛයේ අරමුණ:**

i. පොල් සහ තේ කුඩා ඉඩම් හිමියන් සතු සීමිත ඉඩම් ප්‍රමාණය උපරිම ප්‍රයෝජනයක් ලබාගත හැකි ආකාරයට යොදා ගැනීමට සැලැස්වීම.

ii. පොල් හා තේ භෝග දෙකම සාර්ථකව වැවෙන ඉඩම් වල භෝග දෙකම වැවීමෙන් භූමිය උපරිම ප්‍රයෝජනයට ගැනීම තුලින්, එක් එක් භෝගයේ වෙළෙඳපල වෙනස්වීම් වලින් කුඩා ඉඩම් හිමියාට ඇතිවන අහිතකර ආදායම් තත්ත්වය මග හරවා ගත හැකි වන පරිදි ආදායම් ප්‍රවේශ දෙකක් එකම භූමි ප්‍රමාණයෙන් ලබාදීම.

iii. පරිසර හිතකාමී තත්ත්වයන් වැවිලි ප්‍රදේශ තුල ඇති කිරීම හා පූර්ණ කාලීන රැකියා අවස්ථා වැඩි කිරීම.

iv. තේ සහ පොල් වගාකිරීම පිළිබඳ දිරිදීමනා ක්‍රම ක්‍රියාත්මක කරනු ලබන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රතිපත්ති වලට අනුකූලව දිරිදීමනා ක්‍රම ක්‍රියාත්මක්මක කිරීම.

**ක්‍රියාත්මක උපදෙස්.**

**(1) ඉල්ලුම් පත්‍රය භාර ගැනීම හා අවසර පත්‍ර නිකුත් කිරීම**

පිටපත් 3 කින් සමන්විත ඉල්ලුම් පත්‍රය සහ හිමිකම් ආකෘතිය සම්පූර්ණ කර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයට ලැබුණු පසුව තේ වගාව සඳහා මූලික පරීක්ෂණය පවත්වා වාර්තා කිරීමට පිටපත් 03ම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි වෙත යැවිය යුතුය. තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරි විසින් එහි පිටපත් 3ම සම්පූර්ණ කර එක් පිටපතක් අධිකාරියේ ප්‍රාදේශීය කළමනාකරු වෙතද, දෙවන පිටපත පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙතද යවා තෙවන පිටපත තම ගොනුවට ඇතුලත් කර තබාගත යුතුය.

මූලික පරීක්ෂණ වාර්තාවේ සඳහන් නිර්දේශ අනුව අධිකාරිය මගින් අවසර පත්‍රය නිකුත්කර, නිකුත් කරන ලද අවසර පත්‍ර පිළිබඳ ලැයිස්තුවක් පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත යැවිය යුතුය. අවසර පත්‍ර නිකුත් කිරීමේදී අදාල ආධාර ක්‍රමය පැහැදිලිව හඳුනා ගත හැකිවන පරිදි CT/NP හෝ RP වලින් ආරම්භ කළ යුතුය.

ඉල්ලුම් පත්‍ර භාර ගැනීම හා අවසර පත්‍ර නිකුත් කිරීම අධිකාරියේ දිරිදීමනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන කාලසීමා තුල පැවැත්වෙනු ඇත. මෙම දිරිදීමනා ක්‍රමය ක්‍රියාත්මක කරවීම සඳහාද අධිකාරියේ දිරිදීමනා ක්‍රමය

ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කර ඇති මෙහෙයුම් ක්‍රියාවලිය ඒ අයුරින්ම අදාල වේ.

(2) **බිම් සීමාවන් :**

එක් ඉඩම් හිමියෙකුට/ ඉඩමකට අක්කර 02ක උපරම බිම් ප්‍රමාණයකට යටත්ව එක් වර්ෂයක් තුලදී අවසර පත්‍රයක් නිකුත් කල හැකිය.

(3) **වාර්ෂික වගා වැඩ සටහන :**

පොල් වගාකිරීමේ මණ්ඩලයේ එකඟත්වය මත වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලබන මිශ්‍ර වගා වැඩ සටහනට අදාලව අයවැය යටතේ මුදල් ප්‍රතිපාදන සඳහා ඇස්තමේන්තු කලයුතු අතර, අයවැය ප්‍රතිපාදන සීමාවන්ට අනුකූලව වාර්ෂික වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කලයුතුය. මෙහෙයුම් කරුවන්ගේ කාර්යභාරය වැඩ සටහන යටතේ හඳුන්වා දී ඇති මෙහෙයුම් හා අධීක්ෂණ වැඩ පිළිවෙල මෙයටද අදාල වනු ඇත.

(4) **වගා කරුවන් පුහුණු කිරීම හා උපදෙස් ලබාදීම.**

පොල් වගා කිරීමේ මණ්ඩලයේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයද, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර මණ්ඩලයද, ඒකාබද්ධව අදාල ආයතන දෙකේ සහභාගිත්වයෙන් වගා කරුවන් දැනුවත් කිරීමට හැකි සෑම අවස්ථාවකදීම කටයුතු කල යුතුය. උප කාර්යාල මට්ටමේ දැඩි අධීක්ෂණයක් යටතේ මෙම කටයුතු සිදු කිරීම අපේක්ෂා කරන අතර, නිකුත් කරන ලද අවසර පත්‍රවල කාලීන ප්‍රගතිය විමර්ශනයක් ප්‍රාදේශීය කාර්යාලය මගින්ද , සිදු කල යුතුය.

(5) **තේ හා පොල් වගා කටයුතු සහ පස පුනරුත්ථාපනය කිරීම**

තේ සහ පොල් වගා කිරීමට අදාල සියලුම කටයුතු පොල් සහ තේ මිශ්‍ර වගා කිරීම අත් පොතේ සඳහන් කරුණු වලට අනුකූලව සිදුකළ යුතුය. පොල් සහ තේ මිශ්‍ර වගා වැඩ පිළිවෙල යටතේ , පස පුනරුත්ථාපන කටයුතු කිරීම අනිවාර්ය කෙරේ. මෙහිදී ද, නිර්දේශිත පරිදි තෘණ සිටුවා මාස 06කට පසුව හා මාස 18 ක් සම්පූර්ණ වූ පසු පරීක්ෂණ 02 සිදුකල යුතුය.

තවද පළමු වර්ෂය තුලදීම ඉඩම පිළියෙල කර පස සාරවත් කිරීමට තෘණ සිටුවීම සහ පොල් වලවල් කැපීමත්, පොල්පැල සිටුවීමට යොමු කරවීමත් උදෙසා අවසර පත්‍ර හිමිකරුවන් මෙහෙයවීම ක්ෂේත්‍ර නිලධාරීන් විසින් සිදුකල යුතුය.

(6) **දිරිදීමනා ගෙවීම**

(i) 2000 වර්ෂයේ මාතර, සහ හම්බන්තොට දිස්ත්‍රික්ක අයත් අකුරැස්ස, පස්ගොඩ, සහ කටුවන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ඉඩම් වෙනුවෙන් නියාමක ව්‍යාපෘතියක් වශයෙන් නිකුත් කරන ලද අවසර පත්‍ර යටතේ

(අ) 2001 ජුලි 31 දිනට පෙර නිමකර ඇති ක්ෂේත්‍ර කටයුතුවලට පමණක් තේ වගාවට අදාලවන ආධාර මුදල්ද, එදිනට පෙර පොල් පැල සිටවූ ඉඩම් සඳහා පොල් වගාවට අදාල ආධාර මුදල පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් ලබගෙන ගෙවීම් කර, ගෙවීම් වාර්තාවක් එම කාර්යාලයට ලබාදීමට සහ

(ආ) 2001 ජුලි 31 දින තෙක් පොල් පැල සිටුවා නොමැති ඉඩම් වලට අදාල වන සියලුම කටයුතු මෙම චක්‍ර ලේඛයේ 6 (ii) ඡේදය පරිදි සිදුකල යුතුය.

(ii) පොල් සමග තේ මිශ්‍ර වගා කිරීම සඳහා පිළියෙල කොට ඇති අත්පොතේ සඳහන් තේ වගාවට අදාල දිරිදීමනා වාරිකයත් ඊට අදාල වන්නාවූ වැඩ කොටස් නිමකල බවට පරීක්ෂණ වාර්තා වලින් නිර්දේශ වීමෙන් අනතුරුව ගෙවීම් කල යුතුය. පොල් වගා කිරීමට අදාලව පොල් වගාව සඳහා වූ ප්‍රතිපාදන යටතේ, පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් පොල් පැල පොල් වගා කිරීමෙන් පසු වර්ෂ 04ක් ඇතුලත එම පැල සඳහා අවශ්‍ය පොල් පොහොර සපයනු ලබන අතර, සාර්ථක පොල් වගාවන් සඳහා ඉතිරි මුදලක් වෙතොත් අදාල අත් පොතේ සඳහන් පරිදි පස්වන වසර අවසානයේ වගාකරුට පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් ගෙවීම් කරනු ඇත.

(iii) ඉහත (ii) ට අනුකූලව සහ මෑතදී සංශෝධිත අලුත් වගා ආධාර මුදල අනුව සංශෝධිත ගෙවීම් සටහන මේ සමග අමුනා ඇත. මේ අනුව අත් පොතෙහි 23 පිටුවේ ඇති ආධාර මුදල් සටහන අවලංගු වේ.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ පොල් වගා කිරීමේ මණ්ඩලය අධිකාරිය වෙත එවන ලද අංක :සීඕඑස්/අයිපීසී/ 111 සහ 2001.08.15 දිනැති ලිපියේ සඳහන් එකඟතාවය මත වන අතර ආයතන දෙකේ ඒකාබද්ධ වැඩ සටහනක් ලෙස ක්‍රියාත්මක වීම පිණිසය.

මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව ක්‍රියා කරන බවත්, මා වෙත දැන්වීමට කටයුතු කරන්න.

රෝහණ ඉලංගරත්න
සභාපති.

පිටපත් :-

1. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (වැ.ක. අමාත්‍යාංශය)
2. සභාපති - පොල් වගා කිරීමේ මණ්ඩලය.
3. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන)
4. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති) වැ: බ.
5. සහකාර සාමාන්‍යාධිකාරී (සංවර්ධන/ පරිපාලන)
6. අභ්‍යන්තර විගණක.
7. මුදල් කළමනාකරු.
8. සියලුම සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්.
9. සියලුම ප්‍රාදේශීය ව්‍යාප්ති නිලධාරීන්.
10. සියලුම ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරීන්.
11. සියලුම තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරීන්.
12. සභාපති- සමස්ථ ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය
13. ගරු ලේකම්- කුඩා තේ වතු සමිති ප්‍රාදේශීය සංවිධානය (මාතර/ ගාල්ල/ කළුතර/ රත්නපුර/ ඌව/ නුවරඑළිය/ මහනුවර/ කෑගල්ල)

## පොල් සමග තේ මිශ්‍ර වගාව
## තේ වගාවට ගෙවනු ලබන ආධාර මුදල්

| වාරිකය | අදාල වැඩ කොටස | ආධාර මුදල අදාල වන බෝගය | වාරක මුදල | | |
|---|---|---|---|---|---|
| | | | තේ අළුත් වගාව හෙක්/රුපි | තේ නැවත වගාව | |
| | | | | මහනුවර නුවරඑළිය මාතලේ | අන් සියලු දිස්ත්‍රික්ක |
| 1. | තේ සඳහා බිම සැකසීම, පස සංරක්ෂණ ක්‍රම යෙදීම, තෘණ පේලි වෙන් කිරීමට කානු කැපීම තෘණ සිටුවීම, සෙවන ගස් සිටුවීම. | තේ | 5200.00 | 18750.00 | 15000.00 |
| | පොල් වගාව සඳහා වලවල් කැපීම හා වලවල් වල පොල් පැල සිටුවීම. | පොල් | පොල් පැල ලබාදීම | | |
| 2. | තෘණ වගාව සිටුවා මාස 06ක් තුල නඩත්තු කිරීම | තේ | | 7500.00 | 7500.00 |
| | පොල් පැල සිටුවා මාස 12කින් පසුව මුලින් ලබාදුන් පැල වලින් 30%ක් ඇතුළුව සජීවී පැල 75% කට නොඅඩුව නඩත්තු කිරීම. | පොල් | පොල් පොහොර ලබාදීම | | |
| 3. | තෘණ වගාව මාස 18ක් නඩත්තු කිරීම. | තේ | 6250.00 | 37500.00 | 36000.00 |
| | පොල් පැල සිටුවාමාස 24කින් පසුව මුලින් ලබාදුන් පැල වලින් 30% ක් ඇතුළුව සජීවී පැල 80%කට නොඅඩුව නඩත්තු කිරීම | පොල් | පොල් පොහොර ලබාදීම | | |
| 4. | තෘණ වගාව ඉවත් කර තේ පැල සිටුවීම සඳහා වාරකය | තේ | 26050.00 | 11250.00 | 9000.00 |
| | පොල් පැල සිටුවා මාස 36කින් පසුව මුලින් ලබාදුන් පැල වලින් 30%ක් ඇතුළුව සජීවී පැල 85% කට නොඅඩුව නඩත්තු කිරීම | පොල් | පොල් පොහොර ලබාදීම | | |
| 5. | තේ වගාවේ පාලු සිටුවීම හා පළමු වර්ෂය තුල නඩත්තු කිරීම | තේ | – | 7500.00 | 7500.00 |
| | පොල් පැල සිටුවා මාස 60කින් පසුවද මුලින් ලබාදුන් පැල වලින් 30%ක් ඇතුළුව සජීවී පැල 95%කට නොඅඩුව නඩත්තු කිරීම | පොල් | පොල් පොහොර ලබාදීම | | |
| | දිරිදීමනා වල මුළු වටිනාකම | තේ හෙක්/රුපි | 37500.00 | 82500.00 | 75000.00 |

**වැදගත්:** ඉහත සඳහන් පරිදි පොල් පැල හා පොහොර සැපයීමෙන් පසු ඉතිරි මුදලක් ඇතොත් එය, සාර්ථකව නඩත්තු කල පොල් පැල වගාවන් සඳහා පස්වන වර්ෂය අවසානයේදී පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් වගාකරුට ගෙවනු ඇත.